මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.



Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

බාබා එක්ස් මට ඉතාමත් විශේෂ කෘතියක්. මේ කෘතිය මේ තරම් විශේෂ වෙන්න හේතු ගොඩක් තියෙනවා. මුල්ම හේතුව බාබා එක්ස් පාඨකයින්ගේ නොමඳ ආදරයට සහා ප්‍රශංසාව ලක් වූ පොතක් වීම. අදටත් බාබා එක්ස් වෙනුවෙන් බොහෝමයක් විවේචන විචාර ප්‍රශංසාවන් ඇඟයීම් ලැබෙනවා. බාබා එක්ස් ආගමික මිථ්‍යාව සියුම්ව විචාරයට ලක් කරන කෘතියක් වුවත් මේ කෘතිය ගිහියන් අතර මෙන්ම පූජ්‍ය පක්ෂය අතරත් ජනප්‍රිය වූ කෘතියක්. අදටත් බාබා එක්ස් කියවන ස්වාමීන් වහන්සේලා ඒ වෙනුවෙන් ලබා දෙන ඇඟයීම් ප්‍රශංසනීයයි. අපේ සංඝයා වහන්සේලාට මම ඒ වෙනුවෙන් ගරුකරනවා, ස්තූති කරනවා.

බාබා එක්ස් තුන්වරක් මුද්‍රණය කල කෘතියක්, මෙය තවත් මුද්‍රණය කල හැකියි. තවමත් මිනිසුන් බාබා එක්ස් හොයනවා. මේ කෘතිය පීඩීඑෆ් එකක් ලෙස මේආකාරයෙන් නොමිලේ නිකුත් කල පසුවත් මම බාබා එක්ස් යළි යළිත් මුද්‍රණය කරන බවත් අනිවාර්යෙන්ම කිව යුතුයි. පීඩීඑෆ් කියවන මිනිසුන් සේම පීඩීඑෆ් නොකියවන පොතේ පිටු අතර ගැවසෙමින් මුද්‍රත පොත් කියවීමට කැමති මිනිසුන්ද සිටින නිසාවෙන් මා ඔවුන් වෙනුවෙනුත් මගේ යුතුකම ඉටුකල යුතුයි. ඒ නිසාම බාබා එක්ස් මේ වසර අවසානයේදි එහි සතර වන මුද්‍රණයටත් යනු ඇත.

අවසන් වශයෙන් - බාබා එක්ස් පීඩීඑෆ් එක අතට පත්වෙන හැමෝගෙන්ම මම ඉල්ලීමක් කරනවා. මෙය කියවද්දි මනස විවෘතව තබාගන්න, ඔබ මෙතෙක් දුටු ආගමික මිථ්‍යාවන් ගැනත් හිතන්න පටන් ගන්න, ඔබ ඒවාට ඇබ්බැයි වී ඇත්නම් මිථ්‍යාව නිවැරදිව දකිමින් ඒවායින් නිදහස් විය හැකි මාර්ගයත් සොයන්න පටන් ගන්න. ඒ වගේම පොත කියවූ පසුව ඔබේ හදවතට දැනෙන ඒ නිර්ව්‍යාජ අදහස ඔබට හැකි අයුරින් වචන වලට හරවා පොත්මී ගෘපයේ සටහන් කරන්න.

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

බාබා එක්ස් ගැන ඔබේ අදහසත් දකින්නට මම ආදරයෙන් බලා සිටිනවා.

PothMee Group: https://www.facebook.com/groups/poth.me

මුහුණු පොතේ සොයන්න : PothMee පොත් ලියන සහා කියවන හැමෝගෙම තැන

මේ පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීමට මිස යළිත් විකිණීම සඳහා නොවෙයි. ඒ නිසා කරුණාකර මෙම පිටපත ඩිජිටල් මාධ්‍ය හරහා නොවිකුණන ලෙසත් ආදරයෙන් ඉල්ලමින් මම මගේ අත්සනත් සමගම බාබා එක්ස් පීඩීඑෆ් පිටපත මෙආකරයෙන් මගේ ආදරණීය පාඨකයින් අතට **නොමිලේම සහා නීත්‍යානුකූලවම** ලබා දෙනවා.

කියවන්න, අන් අය සමගත් බෙදාගන්න, ඔබේ අදහසත් ලියන්න....

හැමදාමත් කියනවා වගේ : සතුටින් ජීවත් වෙන්න. දවසක අපි හැමෝම යන්න යනවා, අපේ මතකයන් විතරක් ඉතුරු කරමින්.

ගෙවෙන හැම තත්පරයම සතුටින් ඉන්න උත්සහා ගන්න, ලෝකයට සතා සිවුපාවට ස්වභාව සෞන්දර්යට ප්‍රයෝජවත් දෙයක් කරන්න.

එහෙනම් බාබා එක්ස් වැළඳගන්න. මිථ්‍යාවෙන් එතෙරවී සත්‍ය අවබෝධ කරගන්න

- මුතුමුදලිගේ නිශ්ශංක



03/June/2023

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

ශාන්තිමත් වෙන්න පිංවතුනි,
බාබා එක්ස් පටන් ගන්නවා..!

බාබා X

මුතුමුදලිගේ නිශ්ශංක

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

බාබා X

ප්‍රථම මුද්‍රණය : 2021 ජූලි

2021 ©මුතුමුදලිගේ නිශ්ශංක

ISBN 978-624-5552-02-3

සෝදුපත් පරීක්ෂාව - චින්තක වීරේන්ද්‍ර

පිටු සැකසුම - කාවින්ද්‍යා රත්නායක

කවර නිර්මාණය - ප්‍රදීප් ප්‍රේමලාල්

මුද්‍රණය

විජේසූරිය එන්ටර්ප්‍රයිසස්

350/2 හිඹුටාන පාර,

මුල්ලේරියාව

පොත්මී ප්‍රකාශන

Muthumudalige Holding (Pvt) Ltd.

K. Cyril C Perera Mw,

Kotahena, Colombo. 13

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

රොහාන් දිසානායක

ගුරුපියාණන්ට!

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

පෙර කියවීම ,

(Beta Readers)

රොහාන් මිරිහාගල්ල

මංජුල විජේසිංහ

චින්තක වීරේන්ද්‍ර

කර්තෘගේ අවසරය නිසි පරිදි ලිඛිතව නොලබා මෙහි එන කිසිවක්ම, කවර ආකාරයකින් හෝ නැවත පළ කිරීම තහනම් වෙයි. එම තහනමට: අත් අකුරින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, ශ්‍රව්‍ය හෝ රූපණ ප්‍රකාශන ලෙස නිර්මාණය කිරීම, ඊ-බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුලත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2021

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

මිථ්‍යාව ආගමක් වූ කල...

බාබා X

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

මෙය කියවන විට ඔබේ මනස තුළ කිසියම් වූ
පුද්ගලයෙකු හෝ කිහිපදෙනෙකු මැවෙනු ඇත.

එම තැනත්තා හෝ තැනැත්තන් සමාජය නම් සංකීර්ණ
සමීකරණයේ **'එක්ස්'** යන අඥාත පදයට ආදේශ
කරගන්න...

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

එක්තරා කාල වකවානුවක

"දූපතට තව කොච්චර දුරද?"

"තව කිලෝමීටර් හැටක් විතර ස්වාමි."

ස්වාමි යන වචනය කන වැකුණු විගස ඔහුගේ මුහුණේ වූ කෝපය පහව ගොස් එයට ශාන්ත ස්වරූපයක් ආරූඪ විය.

"ශාන්තී දරුවා.. ශාන්තී..."

ඔහු බෝට්ටු පදින්නාට ආශිර්වාද කොට යළිත් ගොස් බෝට්ටුවේ කෙළවරෙහි වූ බරාඳයෙහිම ඉඳගත්තේය.

ඔහු මේ ආකාරයට පැය තුනකට ආසන්න කාලයක් ඉඳගෙන සිටින්නට ඇත. රාත්‍රියේ ශීතලත්, මුහුදු සුළඟේ තෙතමනයත් ඔහුව විඩාවට පත් කළේය. ඒ සියල්ලටම වඩා බෝට්ටුවේ මෝටරය කරකැවෙන හඬ පැය ගණනක් එක දිගටම ඇසීම නිසා ඔහුගේ කන් පළු පිපිරීමට තරම් වේදනාවක් දැනෙන්නට විය.

විටෙක ඔහු කරෙහි දමා සිටි සුදු සළුවෙන් කනත්, හිසත් හොඳින් වසාගෙන බෝට්ටු බරාඳයේම ඇලවුණේය. විටෙක එතැනින් නැගිට බෝට්ටුකරුවා ළඟටත් යළිත් බරාඳය ළඟටත් ඇවිදින්නට පටන් ගත්තේය. එවිට බෝට්ටු පදවන්නා තමන් දෙස බලා සිටියි නම් අහස දෙස බලාගෙන ඔහුටවත් නොතේරෙන පැරණි සංස්කෘත භාෂාවෙන් මුමුනන්නට පටන් ගත්තේය. තවත් විටෙක දෑත් උකුළට තබා භාවනානුයෝගීව හිඳ සිටියේය. ඔහු මේ සියල්ලම කළේ සිතේ තිබුණු තදියමත්, කෝපයත් සංසිඳවනු සඳහාය.

එහෙත් බෝට්ටුකරුවා තමන්ට හමු වූ මේ අපූරු යෝගී වරයා ගැන පැහැදී සිටියේය, ඔහු බරාඳයෙන් නැගිටින සෑම මොහොතකම, බෝට්ටු පදවන්නාත් පශ්චාත්භාගය මඳක් ඔසවා ඉඳ සිටි තැනින් නැගිට්ටේය. යෝගීවරයා භාවනානුයෝගී වන විට ඔහු මෝටරයේ ශබ්දය අඩු කළේය. ඔහු අහස දෙස බලා

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

ගෙන දෙවියන් හා සංවාදයෙහි යෙදෙන විට බෝට්ටුකරුවාත් එයට සවන් දුන් අතර, 'මේ නම් සාමාන්‍ය යෝගීවරයෙකු නොවිය යුතුය'යි සිතුවේය.

ඉන්දියාවේ පුල්කුඩේ මුහුදු තීරයේදී දූපතට යෑමට තම බෝට්ටුවට නැග ගත් මේ යෝගීවරයාට ඇත්තේ ජීවමාන බාබා වරයෙකුගේ රූපයමය. ඔහුගේ කොණ්ඩය කරල් වලට ගැටගසා එය පිට දක්වා වැටී ඇත, ඔහුගේ නිරුවත් උඩු කයෙහි ඇති රත්‍රං මාල බොහෝමය ඔහු ගෙවා ඇති සෞභාග්‍යමත් ජීවිතය මනාව පිළිබිඹු කරන්නකි. ඔහු ඇඳ සිටි සුදු සිල්ක් ජෝතියේ රැලි පවා මනාව රේඛාවට පිහිටා තිබුණෙන් මොහු නිසැකවම ඉන්දියාවේ වැඩ වසන 'අබ්‍රාජ' නම් වූ උසස් තාපස දිවියක් ගත කරන බ්‍රාහ්මණයෙකු විය යුතු යැයි බෝට්ටු කරුවා සිතුවේය.

එහෙත් ඔහු මෙම පුණ්‍යවන්තයාගෙන් එය අසන්නට ගියේ නැත. ඔහු හැකි තරම් නිහඬව සිටියේය. බ්‍රාහ්මණයෝ තමන් වැනි හීන කුලයේ අයවලුන් සමග කතා නොකරන කොට්ඨාසයකි. ඔහු තමන්ගේ මෙම දුප්පත් බෝට්ටුවට ගොඩ වෙන්නට ඇත්තේද 'ආසිරිලන්තයට' හදිසියේම යා යුතු නිසා විය යුතුය.

බෝට්ටුකරුවා මෝටරය තවත් වේගවත් කළේය. චන්ද්‍රාලෝකයෙන් පැහැපත් වී තිබුණු මුහුදු දිය දෙබෑ කරමින් එය වේගයෙන් ඉදිරියට යන්නට පටන් ගත්තේය.

පැය කිහිපයක් ගෙවී ගියේය. මේ අතර, බෝට්ටු බරාඳයේ ඉඳ සිටි යෝගීවරයා දෑස හොරෙන් විවෘත කර බෝට්ටුකරු දෙසට බැල්මක් හෙළීය.

'ඉක්මනින්ම පලයන්' යැයි නොකියා විටින් විට බෝට්ටුකරුවා අසලට ගොස්,

'තව කොපමණ දුරක් යා යුතුද?' යි ඇසීමේ මන්ත්‍රය දැන් නිසැකවම ක්‍රියාත්මක වී ඇත. තමා මේ දුර ඉක්මනින්ම යා යුතුව ඇති බව බෝට්ටුකරුවාට අවබෝධ වී ඇත. ඔහුගේ මුහුණෙන් සියුම් සිනහවක් මතුවිය.

'යමක් කටින් කීමට වඩා එය ඉඟිකිරීමෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැක.'

ඒ සිනහවත් සමගම ඔහුගේ දෑස බෝට්ටුවේ ආරුක්කුවක ගැට

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

ගසා තිබුණු විදුලි ලාම්පුව වෙතට යොමුවිය. මේ වන විට දූපත් මුහුදු මායිමට ළං වී ඇත්නම් මෙම ආලෝකය ඈතට පෙනීම සුදුසු නැත. මුර සේවයේ නියුතු සෙබළුන්ට එය පෙනුනහොත් මැදියම් රෑයට පෙර කලපුවේ මුහුදු මායිම හරහා රට ඇතුළට පැන ගැනීමේ සැලැස්ම අසාර්ථක වී යනු ඇත. එහෙයින් ඔහු මඳ වෙලාවක් කල්පනා කළේය.

'බෝට්ටු පදවන්නාට මෙය කිව යුත්තේ වෙනස්ම ආකාරයකටය.'

ඔහු තම දෙපා බිම තබා ශාන්තිමත් අයුරින් නැගිට ගත්තේය.

යෝගීවරයා භාවනාවෙන් අත් මිදෙනු දුටු බෝට්ටුකරුවාගේ මෝටරයේ වේගයත් සෙමෙන් බාල වී ගිය අතර ඔහුද පසුපස මඳක් ඔසවා හිටගැනීමට යන්ත දැරීය.

"දරුවා.."

ඒ හඬ ශාන්තිමත්ය. අන්ධකාරය හරහා හමා එන මුහුදු සුළඟත් සමග එම සෞම්‍ය හඬ හදවත කිලිපොළා යන තරම් වූ සතුටක් ගෙනදෙයි. ඒ හඬින් ප්‍රබෝධමත් වූ බෝට්ටුකරුවා ඔහුගේ බුලත් කෑමෙන් රක්ත වර්ණ වී තිබුණු දත් විරිත්තා බැගෑපත් සිනහවක් පෑවේය.

"ස්වාමි.."

"දරුවා, මේ විදුලි ලාම්පුවෙහි ආලෝකය මට පීඩාවක්. එය කරුණාකර නිවා දමන්න."

කී ඔහු ආකාශය දෙස බැල්මක් හෙළුවේය.

"මේ දෙවියන් යහන්ගතවෙන වේලාව. දෙවියන්ට මේ ආලෝකය යහපත් නැහැ දරුවා... ඔවුන් ඔබට ශාප කරාවි."

'ශාපය' යන වචනය ඇසෙත්ම බෝට්ටු කරුවාගේ සිත කැලඹී ගියෙන් ඔහු අල්ලාගෙන සිටි මෝටරයත් අත හැර දමා වේගයෙන් නැගිට ගත්තේය.

"අනේ, සමාවෙන්න ස්වාමි... මේ අසරණයට සමාවෙන්න."

කී ඔහු ලහි ලහියේ ආරුක්කුවේ වූ විදුලි ලාම්පුව වෙතට දුව ගොස් එය නිවා දැමීය.

'කිසිවෙකුටත් බය නැති මිනිස්සු දේව ශාපයට බයවෙති.'

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

ඔහුගේ මුවින් යළිත් සිනහවක් පහල විය. අන්ධකාරයෙන් බෝට්ටුව වැසී යද්දී බෝට්ටු කරුවා තම දෙපා අසල වැඳ වැටෙන අයුරුත් දෙපා සිපගෙන යළිත් මෝටරය වෙත දිව යන අයුරුත් ඔහු යාන්තමින් දිටීය.

"දරුවා.."

ඔහු යළිත් කතා කළේය. දිවයමින් සිටි බෝට්ටු පදින්නා නැවතත් හැරී ස්වාමි දෙස බැලීය.

"දරුවා, මා තව පැය කිහිපයකට අර අඳුරු මුල්ලට ගිහින් අග්‍රඵල භාවනාව පටන් ගන්නවා. ඒ නිසාවෙන් ඔබ කිසිම හේතුවකටවත් මට බාධාවක් විය යුතු නැහැ, ඔබට තේරුණාද?"

"තේරුණා ස්වාමි, තේරුණා.."

බෝට්ටු කරුවා එසේ පවසා යළිත් කිහිප වරක්ම වැඳ වැටුණේය.

බෝට්ටුකරුගේ වැඳ වැටිල්ලත්, බයාදු කමත් ගැන පැහැදී සිටියද, ඔහු විසින් නිරන්තරයෙන්ම පවසන 'ස්වාමි' ආමන්ත්‍රණය කෙරෙහි ඔහුගේ සිතෙහි පැහැදීමක් තිබුණේ නැත. දකුණු ඉන්දියානුවන් තම කුලයට වඩා උසස් කුලයන්හි හැමෝටම එම නමින් ආමන්ත්‍රණය කරන නිසාවෙන් තමන්ට ඊටත් වඩා ගරු ගාම්භීර නාමයක් ලැබිය යුතු යැයි ඔහු සිතන්නට විය.

"බාබා.."

ඔහු කීවේය.

"මොකක්ද ස්වාමීනි ?"

බෝට්ටු කරු යළිත් ඇසුවේය.

"එම්බල, මට බාබා කියාපන්..."

ඔහු එසේ කීවේ යටහත් පහත් තැනැත්තාට තරවටු කරන ආකාරයෙනි. බෝට්ටුකරු එම උස් හඬින් කැලඹී ගියේය. එහෙත් බාබා එය කිසිම ගණනකට නොගෙන එතැනින් නික්ම බෝට්ටුවේ රෙදි වලින් ආවරණය කර තිබුණු එම අඳුරු මුල්ලට ගොස් ඉඳගත්තේය.

* * * * * *

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

හෝරාවක් පමණ ගෙවී ගියේය. දැන් ඔහු දූපතෙහි මුහුදු මායිම ආසන්නයටම පැමිණ ඇත. බෝට්ටුකරුවාගේ මුහුණින් තෘප්තිමත් සියුම් සිනහ රේඛාවක් ඇඳී ගියේය. දැන් ඇත්තේ මුහුදු සීමාවෙන් කලපුව හරහා නගරයට ඇතුළුවන මුර කපොල්ල අසල යෝගී වරයාව බස්සවා යළිත් ඉන්දියාව බලා පිටත් වීමයි.

එහෙත් 'මේ මුහුදු ගමනට යෝගීවරයාගෙන් කීයක් අය කළ යුතුද?'යි ඔහු කල්පනා කළේය. යෝගීවරයා බෝට්ටුවට ගොඩ නැගි මොහොතේ පටන් ඔහු ගමන් ගාස්තුවක් ගැන කතා කර තිබුණේ නැත. ඇරත් බ්‍රාහ්මණයින් මුදල් ගැන අසන්නේ නැත. ඔවුන් කරන්නේ ගෙවීම පමණි. බොහෝවිට බ්‍රාහ්මණයින් මුදල් ගෙවන්නේ වටිනාකමට වඩා කිහිප ගුණයක්ම වැඩියෙනි. එය සිහිපත්වීමෙන් බෝට්ටු කරුවාගේ සිත යළිත් ප්‍රබෝධමත් විය.

'මේ ගමන වෙනුවෙන් හොඳ ගතමනාවක් පමණක් නොව, දේවෝත්තමයාගේ ආශීර්වාදයත් ඔහුට ලැබෙණු ඇත.'

ඔහු තම දෑස පුංචි කර අන්ධකාර මුල්ලේ වාඩි වී සිටින එම මහාර්ඝ බාබා දෙස බැලුවේය.

නැත. ඔහුව පෙනෙන්නට නැත.

ඔහු නිසැකවම දෙවියන් සමග සංවාදයේ යෙදෙනවා විය යුතුය.

තමන් ලද ආශීර්වාදය ගැන උදම් වූ බෝට්ටුකරු තවත් වේගයෙන් මෝටරය කැරකුවේය. එය මුහුදු වැල්ලේ ගැටෙන මොහොත දක්වාම උණුසුම් හදවතින් යුක්තව ගමන් කරන්නට විය.

එහෙත් බෝට්ටුව මුහුදු වැලලේ වැදෙත්ම සිදුවූ සිදුවීමක් නිසාවෙන් ඔහුගේ උද්යෝගයත්, සතුටත් ඒ මොහොතෙහිම පහව ගියේය. බෝට්ටුව කලපුවට ආසන්න මුහුදු කපොල්ලට ඇතුළුවෙත්ම එතැන රැක සිටි මුර සෙබළුන් බෝට්ටුව නවත්වා ගත්තේය. එතැන සිටි රයිෆල් වර්ගයේ තුවක්කු අතින් ගත් සෙබළුන් තිදෙනෙක් කපොල්ලෙහි වූ ලෑලි පාලම දිගේ බෝට්ටුව අසලට ආවෝය.

"උඹ කොහේ ඉඳන්ද ?"

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

"පුල්කුඩේ වල ඉඳන් මහත්තයෝ."

ඔහු දෙමළෙන් පිළිතුරු දුන්නේය.

"ඇයි මෙහේ ?"

මුර සෙබළා එය අසත්ම හඬ වඩාත්ම බාල කළ බෝට්ටු කරු මෙසේ කීවේය..

"උතුම් වූ බාබා වරයෙකුගේ ශුද්ධ වූ ගමනක්."

බොහෝම ගරු ගාම්භීරව ඔහු එසේ කියද්දී එතැන සිටි එක් මුර සෙබළෙක් බෝට්ටුව තුලළට පැන ගත් අතර තවත් අයෙක් ඔහුගේ 'බලපත්‍රය' පරීක්ෂා කරන්නට පටන් ගත්තේය. බෝට්ටුව තුළට පැනගත් සෙබළා තම අතෙහි වූ විදුලි පන්දමත් දල්වාගෙන බෝට්ටුවේ එහා කොනටත් මෙහා කොනටත් ගමන් කළ අතර ඔහුට කිසිවක් දැක ගත හැකි නොවූයෙන් ඔහු බෝට්ටු කරු දෙස බලා කෑ ගසා මෙසේ ඇසීය.

"කෝ උඹ කියපු බාබා?"

බෝට්ටුකරු ඔහුගේ අතක් දිගු කර බෝට්ටුවේ රෙදි කඩවලින් ආවරණය වී තිබූ අඳුරු මුල්ල පෙන්නුවේය. මුර සෙබළා ඔහුගේ අතේ වූ විදුලි පන්දම ඒ දෙසට එල්ල කළේය.

නැත, එතැන කිසිවෙක් නැත.

එය දුටු බෝට්ටුකරුගේ දෙතොල නිරායාසයෙන්ම සෙලවෙන්නට පටන් ගත්තේය.

"බාබා අතුරුදහන් වෙලා..."

ඔහු දෙමළ භාෂාවෙන්ම මිමිණුවේය.

* * * * * *

බෝට්ටුව මුර කපොල්ල අසල මුහුදු වැල්ලේ ගැටෙත්ම තමන් බාබා වරයෙකු යැයි කී තැනැත්තා ක්‍රියාත්මක විය. ඔහු තමන් ඉඳ සිටි අඳුරු මුල්ලේ සිට හෙමින් සීරුවේ වතුරට පැන ගත්තේය. එතැන් සිට මුහුදු කලපුව හරහා අනිත් පස ඉවුරට පිහිනුවේය. බෝට්ටුකරු තම බෝට්ටුව මුර කුටිය අසල නවත්වද්දීත් ඔහු

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

බෝට්ටුවෙන් කිලෝමීටරයක් පමණ ඈතින් වූ, එහා පස ඉවුර වෙතට පැමිණ සිටියේය.

ඉවුරට පැමිණි පසුව ඔහු තමා ඇඳ සිටි ජෝතිය මුහුදු වතුරේදීම උනා දැමීය. සුදු ජෝතිය චන්ද්‍රාලෝකයෙන් දිලිසී පෙනෙන නිසාවෙන් එයත් ඇඳගෙන මුහුදු වැල්ල හරහා දිව යෑම නුවණට හුරු නැතැයි ඔහු සිතුවේය. ඈතින් සිටින මුර සෙබළුන්ට එය දර්ශනය වුවහොත් ඔවුන් තමන් පසු පස ලුහු බඳිනු ඇත. ඒ නිසාවෙන් ජෝතිය උනා දැමූ පසුව ඔහු නිරුවතින්ම දුවන්නට පටන් ගත්තේය. ගල් කොරල් උඩින් පනිමින්, විටෙක මුහුදු වැල්ලේ එරෙමින්, සැඟවෙමින් ඔහු දිව්වේය. එසේ දුවයද්දී ඔහුගේ කරේ වූ **'ඉමිටේෂන් ආභරණ'** එකිනෙක ගැටී සෙලවෙන්නට පටන් ගත් අතර ඉන් නැගී ආ ශබ්දය මුහුදේ ඝෝෂාවද පරයා ඔහුගේ කනට වැදෙන්නට විය. ඔහුට ඒවා ගලවා විසිකිරීමට තරම් සිතක් පහළ විය. එහෙත් ඔහු එසේ කළේ නැත.

'රනින් ආභරණ පැළඳගත් කල සොරාත් රජෙකු වන්නේය. වසලයාත් බ්‍රාහ්මණයෙකු වන්නේය. නිරුවතින් සිටියත් එම ශරීරය වටින්නේමය.' යන පැරණි කියමන මතක් කරගත් ඔහු ඒවා අල්ලාගෙන දුවන්නට විය.

මෙසේ දිව ගිය තැනැත්තා අවසානයේදී කලපුවේ වූ ලඳු කැලෑවකට පිවිසියෙන් එහි ගසකට මුවා වී හතිලන්නට පටන් ගත්තේය.

සියල්ලම හොඳින් සිදුවී ඇත.

ඉන්දියාවේ අග්‍රා පොලිසියෙන් පැන, නවදිල්ලියටත්, එතැනින් චෙන්නායි හරහා තමිල්නාඩුවේ තුතිකෝරින් වලටත් පැමිණි ඔහු දැන් තමිල්නාඩුවෙන් ආසිරිලන්තයට සැපත්වී ඇත. දැන් ඔහුව අල්ලා ගැනීමට සමත් කිසිවෙකුත් නැත. දැන් ඇත්තේ මේ කුඩා දිවයින තම වාසස්ථානය කොට ගෙන ඉතිරි ජීවිත කාලය ගත කිරීමයි.

* * * * * *

ඔහු චන්ද්‍රාලෝකයෙන් පිරී ගිය ලඳු කැලෑව දිගේ පැය

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

කිහිපයක්ම ඉදිරියට ගමන් කොට කැලෑව මධ්‍යයේ පිහිටි ගල් තලාවකට පිවිසියේය. කැලෑවේ ගස් වලින් තොර වූ මැදි බිමක සෑදී තිබුණු මෙම තැනිතලා ගල් තලාව මත මේ මොහොතේ දර ගොඩක් පිළිස්සෙමින් ඇත. එය දකිත්ම ඔහු එතැන වූ ගසකට මුවා වී හිට ගත්තේය. ගල් තලාවක දර ගොඩක් ගසා තිබීම සුභ ලකුණක් විය නොහැක. නිසැකවම මෙතැන දඩයක්කාරයින් හෝ කැලෑ සෙබළුන් ගැවසිය හැකිය. ඔහු ගසට මුවා වී මිනිත්තු කිහිපයක් ඒ අවට විපරමින් බැලුවේය. එහෙත් ඔහු බලාපොරොත්තු වූ ආකාරයෙන් කිසිවෙකුත් ඔහුගේ දෑසට ලක් නොවූයෙන් ගසින් ඉවතට පැමිණි ඔහු ප්‍රවේශමෙන් ඇවිදගෙන එම ගල් තලාව මතට ගියේය.

ගල් තලාව මත ඇති ගිනි ගොඩ මේ වන විට පිළිස්සී අඟුරු බවට පත් වෙමින් තිබුණෙන් හමා එන සිහින් සුළඟට එම ගිනි පුපුරු ඇවිස්සී සෑම අතම විසිරී ගියේය. ඔහු එතැනට වඩාත් ළංවී එම ගිනි ගොඩ දෙසට මනා බැල්මක් හෙළුවේය. මේ නිකන්ම නිකන් ගිනි ගොඩක් විය නොහැක, ගොඩ ගසා තිබුණු දර පිළිස්සී ගිනි බත් වී තිබුණු ආකාරයට මෙය නිසැකවම හවස් වරුවෙහි මළකඳක් පිළිස්සීමට ගැසූ ගිනි ගොඩක් විය යුතුය. රාත්‍රී මුහුදු සුළඟ සමග නිවී ගොස් තිබුණු දර කැබැලි යළිත් ඇවිලෙන්නට ඇත. ඔහු ගල් තලාව මත ටික දුරක් ඇවිද ගොස් ඒ අවට යළිත් විපරම් කර බැලීය. ගල් තලාව අසල තැනින් තැන ගොඩ ගසා ඇති දර කඳන් වලිනුත්, පොළොවේ ඇති අඳුරු කැලලි වලිනුත් මෙය නිසැකවම ගම්මුන් විසින් මළකඳන් පුළුස්සා දමන ඉසව්ව යැයි අවබෝධ කරගත් ඔහු එතැනම ගල් තලාවේ හිඳගත්තේය.

'මෙය මළ සිරුරු ආදාහනය කරන සොහොනක් නම් ගම්මුන් මේ ස්ථානයේ ගැවසෙන්නේ නැත. විශේෂයෙන්ම අන්ධකාරය ගිල ගත් රාත්‍රියක ඔවුන් මෙවන් ස්ථානයකට කෙසේවත් එන්නේ නැත.'

ඔහු එතැන ඉඳගෙන එම දැවී යන අඟුරු දෙස බලාගෙන සිටියේය.

'ජීවත්ව සිටින අයව තඹේකට මායිම් නොකළත් උන් මියගිය එවුන්ට පණ බයයි.'

ඔහු එම ගිනි අඟුරු ගොඩ දෙස බලාගෙන මුමුණමින්

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

සිනාසුණේය. ඉන්පසුව තම පපුවට දැතම තබා ගනිමින් එම අඟුරු ගොඩට වැඳ නමස්කාර කළ හේ,

"මෙතැන දැවී ගිය කිසිවෙකු හෝ වේවා ඔහුගේ ආත්මයට ශාන්තියක්ම ලැබේවා..!"

ප්‍රාර්ථනා කළේය.

එම ප්‍රාර්ථනාවත් සමගම ගිනි අඟුරු ගොඩ අසලම ඇල වුණු බාබා කාල වර්ණ ආකාශය දෙස බලාගෙනම දෑස් වසා ගත්තේය. ගින්න නිවී ගොස් ඇතත් එහි රස්නය තවමත් පොළොවෙන් ඉවත්වී නොමැත. ඔහුගේ නිරුවත් ශරීරය එම උණුසුමින් සන්තර්පණය වන විට, ගමනේ වූ අපහසුතාවයත් වෙහෙසත් නිසාවෙන් ඔහුට එතැනම නින්ද ගියේය.

* * * * * *

නින්දේදී ඔහු සිහිනයක් දුටුවේය. ඔහු විසින් තම දැතින්ම ගෙල මිරිකා මරා දැමූ **'ලසා'** ඔහු ඉදිරියේ හිටගෙන සිටියාය. ඇයගේ නළලේ වූ තිලකය ගලවා තම නළලේ තැබූ ඇය, ඔහුගේ ශරීරය මත හිඳගෙන ඔහුගේ කම්මුලට පහර කිහිපයක්ම එක පිට එක එල්ල කළාය. එම පහරවල් වලින් ආ වේදනාවත් සමගම තමා අසලම කිසිවෙකු හෝ කතා කරනු ඇසුනෙන් බාබා එක් වරම දෑස් විවර කළේය.

ඔහු සිටි ගල් තලාව හිරු එළියෙන් නැහැවී ගොස් ඇත. දෑස් විවර කරද්දීම එම ආලෝකය ඔහුගේ මුහුණටද වැටුණෙන් එක් අතකින් මුහුණ වසාගත් ඔහු නැගී සිටියේය. එහෙත් තමා සිටින්නේ මුළුමනින්ම නිරුවත්ව බැව් අවබෝධ වූ නිසාවෙන් මුහුණ වසා ගත් අතින්ම හෙලුව වසාගත් බාබා වට පිට බැලුවේය. පෙර දිනට වඩා ගල් තලාව පැහැදිලිය. සූර්යාලෝකයෙන් එහි සෑම පැත්තක්ම මනාව දැකගත හැකිය. ඔහුගේ දෑස ගල් තලාව මත තැනින් තැන ගොඩ ගසා තිබුණු අළු සෑයවල් වෙතට ඇදී ගියේය. මෙය ගම්මුන් විසින් නිරන්තරයෙන්ම මළ කඳන් පුළුස්සා දැමීමට භාවිතා කරන ස්ථානයක් විය යුතුය. ඒ නිසාම මෙම සොහොන මත තවත් මොහොතක්වත් සිටිය යුතු නැතැයි අවධාරණය කරගත්

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

ඔහු එතැනින් පිටත්ව යාමට පියවරක් ඉදිරියට තැබුවේය. එහෙත් ඒ මොහොතේම කලින් ඇසුණු කටහඬම යළිත් ඇසුණෙන් ඔහු එතැනම ගල් ගැසී නතර විය.

ඒ මිනිසුන් කිහිපදෙනෙකුගේ කටහඬය. ඔවුන් එකිනෙකා සමග කතා කරමින් ගල් තලාව ඇති ඉසව්ව වෙතට පැමිණෙමින් සිටියි. බාබා පිටුපස හැරී, ඔහු පිටුපසින් වූ ගල් තලාවත් එතැනින් එහාට ඇති කැලෑ රොදත් දෙස බැල්මක් හෙළීය. ඔහුට ඒ පැත්තට දිව යා හැකිය. එහෙත් මිනිසුන් ගල් තලාව අසලටම ළඟා වී ඇති නිසාවෙන් තමන් නිරුවතින් දිව යනු දුටුවහොත් නිසැකවම ඔවුන් තමන්ව ලුහුබඳිනු ඇත. නැත එසේ විය යුතු නැත. ඔහුට ඊටත් වඩා හොඳ උපායක් කල්පනාවට ආවේය.

ඔහු යළිත් රාත්‍රියේ නිදාගෙන සිටි තැනට ගොස් හිඳගත්තේය. එතැන තිබුණු අළු ගොඩින් අළු අහුරක් අතට ගත් ඔහු ඒවා ඔහුගේ පපුවෙහි සහ මුහුණෙහි හොඳින් තවරා ගත්තේය. ඉන්පසුව දැත් දෙපසට තබා භාවනානුයෝගීව වසා ගත් දැසින් යුක්තව හිඳ සිටියේය. තවත් සුළු මොහොතකින්ම ඔවුන් මෙතැනට ළඟාවණු ඇත.

විනාඩි කිහිපයක් ගත වී ගියේය. වනාන්තරය තුළින් මතුවූ මිනිසුන් කිහිප දෙනෙකු ඔහු ඉදිරියට ආවේය. ඔහු වසා සිටි දැස් යාන්තමින් විවර කර එම මිනිසුන් දෙස බැල්මක් හෙළීය. එතැන සිටින්නේ දඩයක්කරුවන් යැයි කිව හැකි සරමකින් පමණක් සැරසුණු උඩුකය නිරුවත් වණු පිරිමින් තුන් දෙනෙකි. ඔවුන්ගෙන් දෙදෙනෙකු අත පොරෝ තිබුණු අතර එකෙකු අතෙහි මැරුණු සතෙකුගේ මළකුණක් විය.

ගල් තලාව ආසන්නයටම පැමිණි තරුණයන් තිදෙනා ගල් තලාව මත භාවනානුයෝගීව වැඩ සිටි නිරුවත් පුද්ගලයා දැක බ්‍රාන්තවී නැවතුණේය. ඔවුන් එකෙකුවත් කතා කළේ නැත. ටික වේලාවක් යන තුරුම ඔහු දෙස විශාල කරගත් දැසින් බලා සිටි තරුණයින් මඳක් ගල් තලාවෙන් පහතට පසු බා ගොස්, එතැනින් ඇත්වූ පසුව එකිනෙකා සමග මුමුණන්නට පටන් ගත්තේය.

"තාපසයෙක්."

එකෙක් කීවේය.

Watermarkly

මෙම පීඩීඑෆ් පිටපත නොමිලේ බෙදාහැරීම සඳහා පමණයි. විකිණීම සපුරා තහනම්.

"නැහැ නිගණ්ඨයෙක්, බලපන් ඒ උත්තමයා ඉන්නේ නිරුවත්ව."

අනෙකා කීවේය.

"කොහොම වුණත් බලගතු කෙනෙක්... මේ සොහොනෙම රාත්‍රියත් ගත කරලා වගේ."

"ඔව්.. ඔව්... බලපන්, අර ඇඟේ ගාගෙන ඉන්නේ මිනී අළු. ආභරණත් තියෙනවා."

ගල් තලාව මත හිඳ සිටි තාපසයාට මේ සියල්ලම ඇසිණ. ඉන්ද්‍රියාවේ ජීවත් වුවත් ඔහු ආසිරිලන්ත භාෂාව හොඳින් දැන උගත් අයෙකි. ඒ නිසාම ඔහු තරුණයන්ගේ සංවාදයට හොඳින් කන්දීගෙන සිටියේය.

ටික මොහොතක් ගෙවී ගියේය, තරුණයින් එකිනෙකා සමග මුමුණාගත් පසුව එතැනින් පසුබා යාමට සූදානම් විය. එහෙත් ඔවුන් දඩයම් කොට තිබුණු සත්ව කුණ දුටු බාබාට ඔහුගේ කට වසාගෙන සිටීමට හැකි වූයේ නැත. කෙසේ හෝ එම සත්ව කුණ තමන් සතු කර ගත හැකිනම් දඩයමක් නොකරම කුස පුරවාගත හැකි වනු ඇත.

"දරුව.."

ඔහු ශාන්තිමත් ස්වරයකින් කතා කළේය.

නිරුවතින් හිඳගෙන සිටි තාපසයාගේ එක් අතක් 'විතර්ක' මුද්‍රාව සමග ඉහළට එසවෙන අයුරුත් ඔහුගේ ශාන්තිමත් කටහඬ වනාන්තරයේ සිහින් සුළඟත් සමග ගලා යන අයුරුත් ඇසුණු දඩයක්කරුවන් තුෂ්ණිම්භූත විය.

"තාපස උත්තමයට අපිව ඇහිලා.... "

එකෙක් කීවේය.

"මෙතැනින් යමු... මේ මළ කුණත් එක්ක තාපසයෙක් ළඟට යන්න සුදුසු නැහැ."

අනෙක් කෙනා කීවේය.

එහෙත් බාබාද එය අත හැරියේ නැත.

"මෙහාට එන්න දරුවා...."

Watermarkly